# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,865 – 2014 මැයි මස 30 වැනි සිකුරාදා – 2014.05.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

## තනතුරු - ඇබෑර්තු

### ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත දැක්වෙන සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්පත් " සර්වේයර් ජනරාල්, සර්වේයර් ජනරාල් කාර්යාලය, අංක 150, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05". යන ලිපිනයට 2014.06.23 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවාගැනීම සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය. තැපෑලෙන් එවන අයදුම්පත් හැර වෙනත් ආකාරයෙන් එවන අයදුම්පත් භාරගනු නොලැබේ.

02. සියලුම අයදුම්කරුවන් පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති බව සහතික විය යුතු ය.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;
(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත හා ශාරීරික වශයෙන් යෝග්‍ය අයකු විය යුතු ය;
(ඇ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ 33ට නොවැඩි විය යුතු ය;
(ඈ) අයදුම්පත් කැඳවන අවසන් දිනට සියලු අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතු අතර ප්‍රතිඵල බලපොරොත්තුවෙන් ඉල්ලුම්පත් ඉදිරිපත් නොකල යුතු ය.

03. *සේවා කොන්දේසි* :

(i) වැටුප් :
මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.
රා. ප. චක්‍රලේඛ අංක 06/2006 (iv) MN-5-2006A
රු. 16,720 - 10 x 320 - 11 x 365 - 15 x 450 - රු. 30,685
(ii) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(iii) රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1434/5 හා 2006.02.27 දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු සිදු කෙරෙන හෝ සංශෝධනවලට යටත්ව තෝරාගන්නා අපේක්ෂකයකු ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගනු ලැබේ.

04. *පත්වීමේ කොන්දේසි* :

(i) බඳවා ගනු ලබන නිලධාරීන් දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ මූලික පුහුණුවක් සඳහා යොදවනු ලැබේ.
(ii) බඳවා ගනු ලබන නිලධාරීන්ට ලබාදෙන රජයේ ගබඩා භාණ්ඩ වෙනුවෙන් රු. 25,000 ක මුදල් ඇපයකට බැඳිය යුතු ය.
(iii) පුහුණු කාලයෙන් පසුව ඉදිරියට තවත් අවුරුදු 06ක කාලයක් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ මිනින්දෝරුවරයකු වශයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට ඔවුන් යටත් වන අතර ඒ සඳහා රු. 150,000කට නොඅඩු වත්කම් ඇති ඇපකරුවකු සමග ගිවිසුමකට හා ඇප ඔප්පුවකට ඔවුන් ඇතුළත් විය යුතු ය.
(iv) බඳවා ගැනීමෙන් පසු ලබා දෙන මූලික පුහුණුවෙන් අනතුරුව පවත්වනු ලබන ලිඛිත විභාගයේ ලකුණු මත තෝරාගත් නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය තීරණය කරනු ලැබේ.

05. *අධ්‍යාපන සුදුසුකම්* :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයකින් මැනුම් විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබිය යුතු ය.

06. *තෝරාගැනීමේ ක්‍රමය* :

සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ. අයදුම්කරුවන් අතරින් අදාළ සුදුසුකම් සපුරා ඇති සියලුම මැනුම් විද්‍යා උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවන අතර, එවිට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් සහ ඒවායේ ඡායා පිටපත් කට්ටලයක් සමග සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) උපාධි සහතිකය ඇතුළු සෙසු අධ්‍යාපන සහතික;
(iii) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iv) චරිත සහතික දෙකක්.-මෙයින් එකක් ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකයක් විය යුතු ය.

07. අවශ්‍ය කොන්දේසි සපුරා නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අයදුම්කරුවකුට නියමිත සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක දී ඔහුගේ පත්වීම අවලංගු කරනු ලැබේ.

09. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරියකු නම් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් තැපෑලෙන් එවන අයදුම්පත් නැතිවීම ගැන වගකීම් භාරගනු නොලැබේ.

10. මෙම බඳවා ගැනීමේ කටයුතු කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ සම්පූර්ණ බලය සහ බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය සර්වේයර් ජනරාල් සතුවේ. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨවල අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය වලංගු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි,

නිහාල් ගුණවර්ධන,
සර්වේයර් ජනරාල්,
ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව.

අංක 150,
කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.
2014 මැයි මස 09 වැනි දින.

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත

01. නම :————.
1.1 මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා : SILVA, A. B.)
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
1.4 ජාතික හැඳුනුම්පත් අංකය :————.
1.5 නිකුත් කළ දිනය :————.
02. ලිපිනය :
2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 ලිපි එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
03. දුරකථන අංක :
ජංගම :————. ස්ථාවර :————.
04. පුරවැසිභාවය :————.
(පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ද යනවග සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් ලියාපදිංචි අංකය සඳහන් කරන්න.)
05. ස්ත්‍රී පුරුෂ භාවය [ ]
ස්ත්‍රී 1, පුරුෂ 0
(අදාළ කොටුව තුළ අංකය ලියන්න)
06. විවාහක/අවිවාහක භාවය :————.
07. උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.
6.1 ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.
08. අධ්‍යාපන සුදුසුකම් :
(i) විශ්වවිද්‍යාලය/ආයතනය :————.
(ii) උපාධිය හා සමත් වූ වසර :————.
(iii) ලියාපදිංචි වූ අංකය හා දිනය :————.
(iv) බාහිර/අභ්‍යන්තර :————.
(v) විභාග අංකය :————.
(vi) පන්තිය (ඉහළ/පහළ) :————.
(vii) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.
09. පරිගණක විද්‍යාව පිළිබඳ හදාරා ඇති පාඨමාලා විස්තර :————.
10. මව් භාෂාවට අමතරව වෙනත් භාෂාවන්ගේ දැනුම සහ සමත්ව ඇති විභාග :————.
11. වෙනත් කුසලතා සහ සුදුසුකම් :————.
12. කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් ඔබ උසාවියෙන් වරදකරු වී ඇත්නම් ඒ හා සම්බන්ධ සියලුම විස්තර දැන්විය යුතු ය. :————.
13. ඔබ දැනට රජයේ සේවයේ නියුතු අයකු නම් අයදුම්පත් භාරගන්නා දිනට වැඩ තහනමකට ලක්ව තිබේ ද යන්න :————.

මා විසින් ඉහතින් ඉදිරිපත් කර ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති විස්තර කිසිවක් වැරදි හෝ අසත්‍ය බැව් අනාවරණය වුවහොත් තෝරා ගැනීමට සලකා බලනු නොලබන බවත් හා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම හොඳාකාරව දනිමි. තව ද මේ සම්බන්ධයෙන් පළ කරන ලද *ගැසට් නිවේදනයේ* සඳහන් සියලු කොන්දේසිවලට මා එකඟ වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණක් මෙම කොටස අදාළ වේ.)

…………………
…………………
…………………

සර්වේයර් ජනරාල්,

මෙම ආයතනයේ සේවය කරන ඉහත සඳහන් …………………… මහතා/මහත්මිය/මෙනෙවිය ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදිය. ඔහු/ඇය කිසියම් විනයානුකූල දඬුවමකට භාජනය කර නොමැති අතර මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් නිදහස් කරනු හැකිය/ නොහැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
නිල මුද්‍රාව.

දිනය :————.

05-850

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 සැප්තැම්බර් මස නගර අංක 1 කොළඹ දී සහ නගර අංක 2 යාපනයේ දී පවත්වනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම පරීක්ෂණය සඳහා අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2014.06.30 වැනි දින බවට මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පවත්වනු ලබන අතර, ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් විසින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක අංක 01 සිට 07 තෙක් විස්තර මුල් පිටුවේ ද, සෙසු කොටස් දෙවන පිටුවේ ද ඇතුළත් කර තම අයදුම්පත සකස් කර ගත යුතු ය. අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විසින් සිය අත් අකුරිනි. තව ද අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල භාෂා ඉල්ලුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ භාෂා ඉල්ලුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර, අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකටම පෙනී සිටීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර දෙකක් ඉදිරිපත් කළ යුතුය. අදර්ශ ඉල්ලුම්පත්‍රයේ ඉහළින් ඇති තොරතුරු අදාළ පරිදි නිවැරදිව සඳහන් කළ යුතු ය. තව ද, විභාග දෙක සඳහා වන විභාග ගාස්තු වෙන් වෙන් වශයෙන් ගෙවා ලදුපත් දෙකක් ලබාගෙන අදාළ ඉල්ලුම්පත්‍ර දෙකට ඇලවිය යුතුය.

03. ඉල්ලුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් (උදා:- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි නම් ප්‍රාදේශීය ලේකම් මගින්) 2014.06.30 දින හෝ ඊට පෙර ''බත්තරමුල්ල, පැලවත්ත, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, විභාග කොමසාරිස් ජනරාල්'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත්‍රය විභාග කොමසාරිස් ජනරාල් වෙත බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ ලදුපතේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සඳහා වන අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම සඳහා වන ප්‍රවේශක නිලධාරීන් විසින් තම අයදුම්පත්‍ර රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍ය අනුව දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් හෝ පිළියෙල කොට ඉදිරිපත් කළ හැකිය.

04. අයදුම්පත්‍ර එවා ඇති සියලුම අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපත සමග ප්‍රවේශපත්‍රය නිකුත් කරනු ඇත. අපේක්ෂකයින් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජුනි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජුනි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.).

සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම්, ඔබගේ ඉහත විස්තර ඇතුළත් ලිපියක, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කොට එය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින් විමසා සිටීම ද සුදුසු වේ. එහිදී අවශ්‍ය තොරතුරු සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වූයේ නම් ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානම්කොට තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

05. *අනන්‍යතාවය :*

අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතරින් එකක් පමණක් භාර ගැනේ. :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීම හෝ නොපිළිගැනීමට හෝ විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

06. *විභාග ගාස්තු :*

මෙම විභාගයට පෙනී සිටින විභාග අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කෙරේ. :-

(අ) එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පළමුවරට ඉල්ලුම් කිරීමේදී විභාග ගාස්තු අය නොකෙරේ.

(ආ) පළමුවන වතාවෙන් පසු එක් එක් විභාගයක් සඳහා රු. 400 ක් බැගින් අය කෙරේ.

(ඇ) එක් විෂයයක් සඳහා රු. 200.00 ක් අය කෙරේ.

අදාළ විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ අංක 2003-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ, නොගැලවෙනසේ අලවන්න. ලදුපතේ ඡායාපිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකට ම ඉල්ලුම් කරන්නේ නම් විභාග ගාස්තු වෙන වෙනම ගෙවූ ලදුපත් දෙකක් ලබාගෙන අදාළ ඉල්ලුම්පත්‍රවල ඇලවිය යුතු වේ.

07. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් කෙරේ. මෙම *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (IIඅ) ඡේදය ආරම්භයේ පළ කරනු ලැබ ඇති විභාග අපේක්ෂකයින් සඳහා නීතිරීති මෙම විභාගය සඳහා ද බල පැවැත්වේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

08. මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති සහ විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍රයක් නිකුත් කර ඇති තමන්ගේ දෙපාර්තමේන්තු/කාර්යාලවල නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා දෙපාර්තමේන්තු/කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතුය. ඉල්ලුම්පත්‍ර යොමු කළ සියලුම අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍රය නිකුත් කරනු ලබන අතර, අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැළපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

11. පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අදාළ වන විෂයය නිර්දේශයන් පහත දක්වා ඇත.

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III වැනි ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය**

*(අ)* පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් පැය තුන බැගින් වන ප්‍රශ්න පත්‍ර 4 කින් සමන්විත වේ.

| | | |
|---|---|---|
| (1) රජයේ මුල්‍ය පරිපාටි | (විෂය අංක - 01) | ලකුණු 100 යි |
| (2) නීතිය හා කළමනාකරණය | (විෂය අංක - 02) | ලකුණු 100 යි |
| (3) පරිපාලනය | (විෂය අංක - 03) | ලකුණු 100 යි |
| (4) වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම | (විෂය අංක 04) | ලකුණු 100 යි |

*(ආ)* සේවා ව්‍යවස්ථාවේ, හා පත්වීම් ලිපියේ විධිවිධාන පරිදි නියමිත කාල සීමාව තුළ හෝ ඊට පෙර හෝ විභාගය සමත්විය යුතු අතර, සියලුම විෂයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වාර කිහිපයකදී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

*(ඇ)* සාමාර්ථ්‍යය සඳහා අයදුම්කරුවන් සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම අවම වශයෙන් ලකුණු 40% ක් බැගින් ලබාගත යුතුය.

**විෂය නිර්දේශය**

(1) *රජයේ මුල්‍ය ක්‍රියා පරිපාටි (විෂය අංක 01)*

රජයේ ගනුදෙනුවලට මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාරයේ චක්‍රලේඛ යොදා ගැනීම, රාජ්‍ය ආදායමට ඇති සම්බන්ධතාව අනුව මුදල් රෙගුලාසි/ක්‍රියා පිළිවෙත්, වියදම්, විදේශ ආධාර, වාර්ෂික හා අතිරේක ඇස්තමේන්තු, රජයේ ණය, සැපයුම් ටෙන්ඩරය, අග්‍රිම හා අත්තිකාරම් මුදල්, අනුඥාත, රාජ්‍ය ගිණුම්, කාර්යබද්ධ හා ආර්ථික වර්ගීකරණයන්, වැඩ සටහන් හා කාර්ය සාධන අයවැය, මුදල් ආමාත්‍යවරයාගේ කාර්යයන්, මහා භාණ්ඩාගාරය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, ලේකම්වරු, විගණකාධිපති හා රජයේ ගිණුම් කමිටුව සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛ යොදා ගනු ලබන ආකාරය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනීම පරීක්ෂා කෙරේ.

(2) *නීතිය හා කළමනාකරණය (විෂය අංක - 02)*

**නීතිය :**
නීතිය පිළිබඳ නිර්වචනය
ශ්‍රී ලංකාවේ නීති පද්ධති
ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධති
ගිවිසුම් නීතිය
නියෝජිතායතන නීතිය
භාණ්ඩ විකිණීම
වාරික මුදල් ගෙවීමේ ක්‍රමයට මිලදී ගැනීම
ගනුදෙනු කළ හැකි පිළිනයන්
ඇප සහතික කිරීම
රක්ෂණය

**කළමනාකරණය :**
කළමනාකරණය පිළිබඳ හැඳින්වීම
කළමනාකරුවන්ගේ කාර්යන් හා දක්ෂතා
සැළසුම් ක්‍රියාවලිය හා සංවිධාන මට්ටම් ඇති කිරීම
සංවිධාන ව්‍යුහය
මානව සම්පත් කළමනාකරණය
කාර්ය සාධන අගැයීම
ප්‍රවර්ධනය
අභිප්‍රේරණය
නායකත්වය
සන්නිවේදනය
තීරණ ගැනීම
ගැටලු නිරාකරණය
වෙනස්වීම් කළමනාකරණය
කළමනාකරණ ගැටුම්
කළමනාකරණ කාලය
තත්ත්ව චක්‍ර හා නිෂ්පාදන හා ඵලය
කළමනාකරණ ආචාර ධර්ම හා වගකීම්

(3) *පරිපාලනය (විෂය අංක - 03)*

ආයතන සංග්‍රහයේ පරිච්ඡේද vii, ix, xi, xii, xv, xxiii, xxv, xxvi, xxvii, xxviii, xxix, xxx, xxxi, xxxii, xxxiii, xLvii, xLviii රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පළමුවන කාණ්ඩයේ i සිට vi දක්වා පරිච්ඡේද

(4) *වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම (විෂය අංක 04)*

කළමනාකරණ තොරතුරු සම්බන්ධයෙන් කාලානුරූප වීමේ නිරවද්‍යතාව සහ පරිපූර්ණ බවෙහි වැදගත්කම.

ආශ්‍රය තොරතුරු පරිහරණය
කාලානුරූප හා තදුචිත වාර්තා
රැස්වීම් වාර්තා හා සටහන් ලිවීම
කළමනාකරණ වාර්තා ව්‍යුහය
විශේෂයක් දැක්විය යුතු වැදගත් ප්‍රතිඵල
ප්‍රතිඵල අර්ථකථනය
විචල්‍යයන් යෝජනා කිරීම
දත්ත විශ්ලේෂණයේ දී සංඛ්‍යානාම ක්‍රම භාවිතය
කාර්ය සාධනය සැසඳීම
කළමනාකරණ වාර්තාවල අනුපාත හා ප්‍රතිශත භාවිතය
රේඛා චිත්‍ර මගින් නිරූපනය
වෘත්තීමය කථා හා දේශනවලට සවන්දීම
කථනයෙන් දේශන වාර්තා කිරීම
විෂය මඩුලු සාකච්ඡා
සම්මන්ත්‍රණ දක්ෂතා
කථා පැවැත්වීම

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වන දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂය නිර්දේශය**

*(අ)* දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත :-

| | | |
|---|---|---|
| (1) කළමනාකරණ ගණකාධිකරණය | (විෂය අංක 05) | - ලකුණු 100 යි |
| (2) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | (විෂය අංක 06) | - ලකුණු 100 යි |
| (3) කළමනාකරණය හා සංවිධානය | (විෂය අංක 07) | - ලකුණු 100 යි |

*(ආ)* සේවා ව්‍යවස්ථාවේ හා පත්වීම් ලිපියේ විධිවිධාන පරිදි නියමිත කාල සීමාව තුළ හෝ ඊට පෙර හෝ විභාගය සමත්විය යුතු අතර, සියලුම විෂයයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයකදී හෝ පෙනී සිටීමට නිලධාරියෙකුට අවසර ඇත.

*(ඇ)* සාමාර්ථයක් ලබා ගැනීම පිණිස එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණුවලින් අවම වශයෙන් 40% ක් අපේක්ෂකයින් ලබා ගත යුතු ය.

*විෂය නිර්දේශය :*

(1) කළමනාකරණ ගණකාධිකරණය (විෂය අංක 05) - පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි.

ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

ගිණුම් ප්‍රතිපෝෂක පිළිබඳ පාලන න්‍යාය, විවෘත සහ සංවෘත, මූලික හා ව්‍යවහාරික ප්‍රශස්ත, සම්මත පිරිවැය ක්‍රම, කාර්යඵල ප්‍රමිති සහ ඇගයීම ප්‍රමිති පිළිබඳ මූලධර්ම හා ඒවා යොදා ගැනීමේ ව්‍යවහාර ක්‍රම, ප්‍රමිති සංශෝධනය, ඉගෙනුම් චක්‍ර සහ අභිප්‍රේරණය, නිර්ණය කිරීම, විචලනයන් සහ උපවිචලනයන් විශ්ලේෂණය කිරීම, ඒවායේ වැදගත්කම, ඉදිරිපත් කිරීම සහ විභාග කිරීම, පාලන ගණකාධිකරණයේ චාර්යායන්ත අංගයන්, අයවැය ලේඛන සම්පාදනය කිරීමේ සංකල්පය, අයවැය පාලනය පිළිබඳ පරිපාලනය, අයවැය ලේඛන සංග්‍රහය, ස්ථාවර හා නම්‍ය අයවැය ලේඛන, ප්‍රධාන සහ අතුරු අයවැය ලේඛන, අයවැය කේන්ද්‍ර, අයවැය පිළියෙල කිරීමෙහිලා කළමනාකරණ සහභාගිත්වය, මැදිහත්වීම හා අභිප්‍රේරණය, අයවැය කාලසීමාව සහ ප්‍රධාන අයවැය සාධකය හඳුනා ගැනීම.

(2) *රාජ්‍ය මූල්‍ය කළමනාකරණය (විෂය අංක 06)*

රාජ්‍ය මූල්‍ය කළමනාකරණය - පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි.

ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

රජයේ ගණකාධිකාරීවරයාගේ කාර්ය භාරය :

රජයේ මුදල් පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යස්ථාමය සහ නෛතික රාමුව, ආයතනික රාමුව, මධ්‍යම ආණ්ඩුව, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන, සමුපකාර ව්‍යාපාරය යනාදිය.

පාර්ලිමේන්තුවේ පාලනය, මහා භාණ්ඩාගාරයේ කාර්යයන්, ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ඇස්තමේන්තු කාරක සභාව, විගණකාධිපති, රාජ්‍ය ගිණුම් කාරක සභාව, ඒකාබද්ධ අරමුදල, පාර්ලිමේන්තුව විසින් කරනු ලබන පාලනයන් පිළිබඳ ගැටලු.

මූල්‍ය චක්‍රය, ක්‍රමසම්පාදන වැඩ සටහන් සැකසීම, අයවැය ලේඛන සම්පාදනය, අරමුදල් අනුමත කිරීම, ගිණුම් තැබීමේ කටයුතු, වාර්තා කිරීම, ඇගයුම හා විගණනය.

ව්‍යාපෘති අගයනය කිරීම, සේවා මිල ගණන් සහ සංඛ්‍යානමය දත්ත භාවිතය, ගෙවීම් න්‍යාය සහ අපේක්ෂිත අගය තීරණය කිරීම.

පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය, වට්ටම් කළ මුදල් ප්‍රවාහය, අභ්‍යන්තර ඵලදා අනුපාතිකය, ව්‍යාපෘති තත්ත්වායනය, ව්‍යාපෘති සම්පාදනය සහ අගයනය කිරීම පිළිබඳව ආර්ථික මූල්‍ය හා කළමනාකරණ අංශ, සාර්ථක ලෙස ව්‍යාපෘති ඉදිරිපත් කිරීම.

වැඩ සටහන් සම්පාදනය කිරීමේ ශිල්ප ක්‍රම, ජාල විශ්ලේෂණ ක්‍රම භාවිතා කිරීම, සම්පත් පැවරීම, ප්‍රවාහනය පිළිබඳ ගැටලු, ප්‍රයෝජනයට ගැනීම හෝ කාලයාගේ ඇවෑමෙන් පිරිහීමට පත් වන වත්කම් සහ එසේ පිරිහීමට පත් නොවන, එහෙත් යම් කලක් පාවිච්චි කිරීමෙන් හෝ කලක් ගතවීමෙන් පසුව හෝ නිශ්ඵල බවට පත්වන වත්කම් වෙනුවට වත්කම් යෙදීම, කාර්ය සාධන අයවැය ලේඛන, මූලික ක්‍රම ස්ථාපනය සහ භාවිතය, කාර්ය සාධනය මැනීම, මිණුම් වර්ග, ඒකක සහ ප්‍රතිමාන තේරීම, මිනුම් ක්‍රම සහ කාර්ය සාධන විශ්ලේෂණය.

වැඩ සටහන් අයවැය, වැඩ සටහන් ව්‍යුහය, කාර්යන් අනුව වර්ගීකරණය, වැඩ සටහන් කටයුතු, වැය ව්‍යාපෘතීන් සහ වැය විෂයයන්, ආර්ථික සහ කාර්ය බද්ධ වර්ගීකරණය.

මූල්‍ය පාලන ක්‍රම, වගකීම් භාරය, අභ්‍යන්තර පාලනය සහ මුදල් රෙගුලාසි, අභ්‍යන්තර විගණනය, කාර්යක්ෂමතා විගණනය, කළමනාකරණ විගණනය, විචල්‍යතා විශ්ලේෂණය, ප්‍රාග්ධන අයවැය සම්පාදනය කිරීම පිළිබඳ තීරණය, දිගුකාලීන ක්‍රම සම්පාදනය සහ එහි වැදගත්කම, පූර්වකථනය කිරීම, නිරවද්‍යතාව සහ සීමාවන්, අවදානම් විශ්ලේෂණය, තීරණ වෘක්ෂ, සම්භාවිත සාධක.

ප්‍රාග්ධනය සඳහා ඉල්ලුම, ප්‍රාග්ධන ඵලදායිකත්වය සහ ඉපැයුම් ඇස්තමේන්තු කිරීම පිළිබඳ ගැටලු, ව්‍යාපෘති ප්‍රමුඛතාවයන් තත්ත්වායනය කිරීමේදී අවිනිශ්චිතතාවන් සඳහා ඉඩ තැබීම, පිළිගෙවුම් නිශ්චායකයන්, ඵල අනුපාතිකය ගණනය කිරීම, ශුද්ධ වර්තමාන අගය සහ වටට්ම් කළ මුදල් ප්‍රවාහයේ ප්‍රතිලාභ, අයබදු ගැනීමේ බලපෑම, ආයෝජන ප්‍රෝත්සහනය, ව්‍යාපෘති පිරිවැය පාලනය සහ පශ්චාත් විගණනය.

හැකියා පිළිබඳ තීරණ .- නිෂ්පාදන ප්‍රකීර්ණකය, නිෂ්පාදනය කිරීම හෝ මිලට ගැනීම, විකල්ප නිෂ්පාදන ක්‍රම, කර්මාන්ත ශාලා වසා දැමීම පිළිබඳ ගැටලු, මිල කිරීමේ ප්‍රතිපත්ති සහ දායක න්‍යාය, පාරිභෝගික ඉල්ලුම් රටාවන්ගේ බලපෑම, ඉල්ලුම් නම්‍යතාව, අලෙවි කිරීමේ උපාය මාර්ග, කාර්ය සාධන ඇගයීමේ ශිල්ප ක්‍රම, ලාභදායකත්වය පිළිබඳ නිශ්චායකයන් සහ අනුපාත.

පිරිවැය වාසි විශ්ලේෂණය, කාරක ප්‍රාග්ධන කළමනාකරණය.

රාජ්‍ය වාණිජ ව්‍යාපාරවල මුදල් පාලනය, අයවැය සම්පාදනය, කළමනාකරණ වාර්තා කිරීම, ගිණුම් අර්ථකථනය සහ මුදල් අනුපාත භාවිතය.

රාජ්‍ය ව්‍යවසායන් හි මිල නියම කිරීම.

ගිණුම් සැලැස්ම අන්තර්ගත කරුණු, රජයේ වාර්තා සහ රාජ්‍ය ව්‍යාපාර.

(3) කළමනාකරණය හා සංවිධානය (විෂය අංක - 07) පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි.

ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

කළමනාකරණය සහ සංවිධාන මූලධර්ම පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය, රාජ්‍ය අංශයේ ගැටලු සහ ප්‍රශ්න සම්බන්ධයෙන් මෙම මූලධර්ම භාවිතය මෙන්ම නවීන කළමනාකරණ උපක්‍රම සහ ශිල්ප ක්‍රම පිළිබඳ ඔහුගේ දැනුම නිර්ණය කිරීම පිණිස මෙම විෂය අලලා ප්‍රශ්න සකස් කරනු ඇත.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2014 මැයි මස 30 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

ආදර්ශ අයදුම්පත්‍රය [ ]

කාර්යාලයීය ප්‍රායෝජනය සඳහා

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014

First and Second Efficiency Bar Examinations for Officers in Grade III of the Sri Lanka Accountants' Service - 2014

දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය.

* විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය සහ නගර අංකය : නගරය [ ] නගර අංකය [ ]

(නිවේදනයේ පළමු ඡේදයට අනුව නගරය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න.)

* විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(ඉල්ලුම් කළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)
සිංහල - 2
දෙමළ -3 [ ]
ඉංග්‍රීසි -4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

* ඉල්ලුම් කරන කාර්යක්ෂමතා කඩඉම් විභාගය :
පළමුවන - 1 [ ]
දෙවන - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

**(ගැසට් නිවේදනයේ 02 වැනි ඡේදය බලන්න. විභාග දෙක සඳහා වෙන වෙන ම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.)**

01. නම :
1.1 මුල’කුරු අගට යොදා මුල’කුරු සමග :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් *උදා* :SUNIL, A. B.)
1.2 සම්පූර්ණ නම :—————.
(සිංහලෙන්/දෙමළෙන්)
1.3 ජාතික හැඳුනුම්පත් අංකයඃ [ | | | | | | | | | ]
1.4 දුරකථන අංකයඃ [ | | | | | | | | | ]

02. කාර්යාලයීය ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.1 කාර්යාලයීය ලිපිනය :—————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ -0 ස්ත්‍රී - 1 [ ] (අදාළ අංකය කොටුව තුළ යොදන්න.)
3.2 උපන් දිනයඃ වර්ෂයඃ [ | | | ] මාසයඃ [ | ] දිනයඃ [ | ]
3.3 ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :
අවුරුදුඃ [ | ] මාසඃ [ | ] දිනඃ [ | ]

04. *ගැසට් නිවේදනයේ* 10 වැනි ඡේදය යටතේ ඉදිරිපත් වන විෂයයන් :
(එක් ඉල්ලුම්පත්‍රයක සම්පූර්ණ කළ යුත්තේ ඉල්ලුම් කරන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ 04 (i) හෝ 04 (ii) හෝ පමණි.)

04 (i) පළමුවන කාර්යක්ෂමතා කඩඉම :

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| ...................... | [ ] |
| ...................... | [ ] |
| ...................... | [ ] |
| ...................... | [ ] |
| ...................... | [ ] |

04. (ii) දෙවන කාර්යක්ෂමතා කඩඉම :

| *විෂයය* | *විෂය අංකය* |
|---|---|
| ...................... | [ ] |
| ...................... | [ ] |
| ...................... | [ ] |

05. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III වැනි ශ්‍රේණියට ඇතුළත් වූ දිනය :—————.
(නිත්‍ය වශයෙන් රාජකාරී භාර ගත් දිනය සඳහන් කළ යුතුයි.)

06. සේවා ස්ථානයේ නම (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නම් එම කාර්යාලයේ නම) :—————.

07. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :—————.

08. පරීක්ෂණයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු :
(i). ගෙවූ කාර්යාලය :—————.
(ii). ලදුපත් අංකය :—————.
(iii). දිනය :—————.

| ලදුපත නොගැලවෙනසේ හොඳින් අලවන්න (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
|---|

09. ඉහත සඳහන් විස්තර නිවැරදි බව ද, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බව ද ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට මම එකඟ වෙමි.

—————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :—————.

*සටහන.-* තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ තමාගේ ප්‍රාදේශීය ප්‍රධානියා ඉදිරිපිට දී අයදුම්කරු අත්සන් කළ යුතු ය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිණියක වූ, මා පෞද්ගලිකව දන්නා හඳුනන ................................ මයා/මිය/මෙනවිය ................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවට මෙයින් සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
දිනය :—————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,
(ii) අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

තනතුර :—————.
දිනය :—————.
05-799

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**අධිකරණ භාරයට ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද මෝටර් රථ මුද්‍රා තැබූ මිල ගණන් කැඳවා විකිණීම පිණිස මහාධිකරණය විසින් ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම - 2014**

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද ලොරි රථයක් ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යටතේ විකිණීමට තිබේ. මෙ සඳහා වූ ඉල්ලුම් පත්‍ර 2014 ජුනි මස 16 වැනි දින ප. ව. 3.00 දක්වා භාරගනු ලැබේ.

මෙලෙස ටෙන්ඩර් පත්‍රිකා මගින් විකිණීමට තීරණය කර ඇති වාහනවල අයිතිය ඉල්ලන කවුරු හෝ සිටියි නම්, ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම අවසාන දින ප. ව. 3.00 ට පෙර ලේඛන සහිතව තමන්ගේ අයිතිය ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදක්වන බවත් දන්වා සිටිමු.

සියලු ඉල්ලුම්පත්‍ර, මහාධිකරණ විනිසුරු මහාධිකරණය, මඩකලපුව යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය. ඉල්ලුම්පත්‍ර යැවීමේ දී ලියුම් කවරයේ ඉහල කොටසේ "මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද ලොරි රථ ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යනුවෙන් සඳහන් කළ යුතු ය."

මහාධිකරණ මුද්‍රාව හා මහාධිකරණ ගණකාධිකාරි තැනගේ අත්සන සහිත ඉල්ලුම්පත්‍ර පමණක් පාවිච්චි කළ යුතු ය.

මේ සඳහා ආපසු නොගෙවනු ලබන රු. 100ක් සමග, පහත පරිදි තැන්පත් මුදල් තැන්පත් කළ යුතු ය. මෙම ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම 2014 ජුනි මස 13 වැනි දින ප. ව. 3.00 ට අවසන් වනු ඇත.

| අනු. අංකය | වාහනයේ විස්තර | වාහනයේ වර්ගය | නඩු අංකය | විකිණීම සඳහා ලබාදෙන ලද අංක | තැන්පත් මුදල |
|---|---|---|---|---|---|
| 01. | ලොරි රථ 01 | LA Ley JS -6297 | ඒආර් 449/11 | MC/BAT/02/2013 | 2,000.00 |

වලංගු කාලය තුළ ලැබෙන මුද්‍රා සහිත සියලු ඉල්ලුම් පත්‍ර 2013 ජුනි මස 16 වැනි දින ප. ව. 3.00 ට පැමිණ සිටින ඉල්ලුම්කරුවන් ඉදිරිපිට, මහාධිකරණ සම්පාදන කමිටුව විසින් විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා මගින් ඉහල මිලක් සඳහන් කොට ඉල්ලුම් කර ඇති ඉල්ලුම්කරුවන්ට එම වාහනය විකිණීමට මඩකලපුව මහාධිකරණ සම්පාදන කමිටුව අනුමැතිය ලබාදෙයි. ඒ අනුව ඉදිරි විකිණීම් කටයුතු අදාළ අධිකරණය විසින් සිදු කරනු ලැබේ.

ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට තීරණය කර ඇති වාහනය කාර්යාල දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 2.30 දක්වා වූ කාලය තුළ අදාළ මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය ඇතුව නිරීක්ෂණය කළ හැකි ය.

විකිණීමට තීරණය කර ඇති වාහන සඳහා තක්සේරු මිල ලබාගෙන ඇති බැවින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවල සඳහන් මිල තක්සේරු මිලට වඩා අඩුවෙන් පවතියි නම්, එම වාහන විකිණීම අත්හිටුවා දැමීමට ටෙන්ඩර් මණ්ඩලයට පූර්ණ බලය ඇත.

විකුණන ලද වාහන, මුදල් ගෙවා රිසිට් පත් ලබාගත් වහාම අධිකරණ භූමියෙන් ඉවත් කළ යුතු ය. එමෙන් ම සියලු ගෙවීම් මුදලින් සිදුකළ යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ. ඉහත ටෙන්ඩර් මගින් සිදුකරන විකිණීම් පිළිබඳ අවසන් තීරණය ගැනීම මඩකලපුව සම්පාදන කමිටුව සතු ය.

මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
මඩකලපුව.

05-852

---

## බඩු බාහිරාදිය විකිණීම්

**බස්නාහිර පළාත්බද මහාධිකරණය - පානදුර**

පානදුර මහාධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද සහ අයිතිවාසිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2014.06.28 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ භාර ගැනීමේ දී සහ මුදල් ගෙවීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, භාණ්ඩ මිල දී ගැනීමට එන සෑම අයකු ම තම ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

06. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ ප. ව. 6.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

සරෝජනී කුසලා වීරවර්ධන,
බස්නාහිර පළාතේ මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
පානදුර.

2014 මැයි මස මස 05 වැනි දින,
පානදුර මහාධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 1524/01 | කැති 01 |
| | | උදළු 01 |
| 02. | 1875/04 | කැති 01 |
| 03. | 1371/99 | පරණ යකඩ පුටුවක් |
| 04. | 2106/06 | කැඩී ඇති ප්ලාස්ටික් පුටු 01 |
| 05. | 2260/06 | මේසන් හැඳි 01 |
| 06. | 2227/06 | කැති 01 |
| 07. | 1851/04 | කැති 01 |
| 08. | 1894/04 | පොරොවක් |
| 09. | 2193/06 | මෝල්ගස් 01 |
| 10. | 1950/05 | මන්නා පිහි 01 |
| | | කැති 01 |
| | | හිස්වැසුම් 01 |
| 11. | 2610/09 | මෝල්ගස් 01 |
| 12. | 1889/04 | අලවංගු 01 |
| 13. | 1974/05 | යකඩ උල් 01 |
| 14. | 2404/07 | ජංගම දුරකථන 0 1 |
| 15. | 2034/05 | මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන 01 |
| 16. | 1915/05 | අබලන් පාපැදි 01 |
| 17. | 2017/05 | අබලන් පාපැදි 01 |
| | | අලවංගු 01 |
| 18. | 2779/11 | නොකියා වර්ගයේ දුරකථන 01 |
| | | ගෑස් සිලින්ඩර් 01 |
| 19. | 2083/05 | පරිගණක මොනිටරය |
| | | මුද්‍රණ යන්ත්‍රය |
| | | මධ්‍ය සැකසුම් ඒකකය |
| | | යතුරු පුවරුව |
| | | මවුසය |
| 20. | 2210/06 | ගෑස් සිලින්ඩර 01 |
| | | උදුන සවිකර ඇති ගෑස් සිලින්ඩර 01 |
| | | පිත්තල සෙම්බු 01 |
| | | හීරෝ වර්ගයේ ලැගේජ් එක සහිත අබලන් පාපැදි 01 |
| | | ජංගම දුරකථනයක් |
| 21. | 2820/11 | ලැප්ටොප් 01 |
| | | ස්කැනර් 01 |
| | | ප්‍රින්ටර් 01 |
| 22. | 2415/07 | රන් ගුලි 02 |
| 23. | 87603(M.C) | ජිප්සි ජෝඩු 01 |
| 24. | 2974/13 | රිදී පැහැති මාල 04 |
| 25. | 2567/09 | බෝකොළයක හැඩැති පෙන්ඩන්ට් 01 |
| | | රන් මාල 01 |
| 26. | 88021 | රන් යැයි කියනු ලබන කරාබු කුට්ටම් 01 |
| 27. | 2722 | කැඩී ගිය අඟුලක් |
| 28. | 2140/06 | අංක 9 ශ්‍රී 3919 දරන යතුරු පැදිය හා හෙල්මට් 01 (අමතර කොටස් ලෙස) |
| 29. | 2639/09 | අංක 200-1956 දරන බජාජ් වර්ගයේ අබලන් ත්‍රීරෝද රථ 01 (අමතර කොටස් ලෙස) |
| 30. | 2895/12 | අංක WPMD 1284 දරන යතුරු පැදිය හා හෙල්මට් 01 |
| 31. | 3020/13 | අංක WPMM 4417 දරන බජාජ් CT 100 වර්ගයේ යතුරුපැදි 01 |
| 32. | 3036/13 | අංක WPMZ 6540 දරන බජාජ් ඩිස්කවරි වර්ගයේ යතුරුපැදි 01 |
| 33. | 2412/07 | අංක WPHF 2799 දරන බජාජ් වර්ගයේ අබලන් ත්‍රීරෝද රථ 01 (අමතර කොටස් ලෙස) |
| 34. | - | වහලෙන් ඉවත් කරන ලද උළු තොගයක් |
| 35. | කාර්යාල උපකරණ | අබලන් කැබිනට් (වානේ ලාච්චු 04) 06 |
| 36. | එම | අබලන් ඇඳි පුටු 09 |
| 37. | එම | අබලන් ෆිල්ටර් ස්ටෑන්ඩ් 01 |
| 38. | එම | අබලන් කැල්කියුලේටර් 04 |
| 39. | එම | අබලන් ලී ට්‍රේ 07 |
| 40. | එම | අබලන් කොකු ඇමුණුම් යන්ත්‍ර 04 |

05-764

---

## රජයේ නොවන දැන්වීම්

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි

සමාගමේ නාමය : සිස්-ලින්ක් නෙට්වර්ක් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98410
ලියාපදිංචි දිනය : 2014 මැයි 05
ලිපිනය : අංක 29 වැනි සැතපුම් කණුව, ගාලු පාර, කලමුල්ල, කළුතර දකුණ.

සමාගම් ලේකම්වරු.

05-769

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි

සමාගමේ නාමය : කොරියන් හයර් එඩියුකේෂන් සෙන්ටර් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 98186
ලියාපදිංචි දිනය : 2014 අප්‍රේල් 17
ලිපිනය : අංක 237/1, හැව්ලොක් පාර, කොළඹ 06.

සමාගම් ලේකම්වරු.

05-770

---

**ඇටෝර්නි බලය අහෝසි කිරීම**

මඩකලපුව ත්‍රිකුණාමලය පාර, ඒරන්ස් මාවත, අංක 365/2 දරන ස්ථානයේ පදිංචි අරුණ කෙන් නොහොත් (අරුණා දේවරාජ්) වන මා විසින් මඩකලපුව, නාවත්කුඩා මදර් පාර, අංක 33 හි පදිංචි ආරුමුගන් කාන්තාමුත්තු නඩරාජා යන අය මාගේ ඇටෝනි බලකරු වශයෙන් පත්කරන ලද මඩකලපුවේ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. චින්නයියා විසින් ලියා සහතික කරන ලද 1993 නොවැම්බර් මස (1) පළවන දිනැති අංක 2125 දරන ඇටර්නි බලපත්‍රය වර්ෂ 2012 ඔක්තෝබර් මස 19 වැනි දින පටන් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් දැනුම් දෙන අතර වර්ෂ 2012 ඔක්තෝබර් මස 19 වැනි දින සිට එකී ආරුමුගන් කාන්තාමුත්තු නඩරාජා යන අය මා වෙනුවෙන් ඇතුළත් වන කිසිදු ගිවිසුමක් වෙනුවෙන් මා කිසිදු වගකීමක් නොදරන බව මෙයින් දැනුම් දෙමි.

අරුණ කෙන් නොහොත් (අරුණා දේවරාජ්).

අංක 365/2, ඒරන්ස් මාවත,
ත්‍රිකුණාමලය පාර,
මඩකලපුව.

05-784

---

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීමයි**

කැළණිය, වෙද මුල්ල, නුවර පාර, 1 වැනි පටුමග, අංක 102 හි පදිංචි ජෙනිෆර් ඇන්ටනට් පෙරේරා වන මා විසින් කැළණිය, වෙද මුල්ල, නුවර පාර, 1 වැනි පටුමග, අංක 102 හි පදිංචි නෙස්ටා පෙරේරා හෙවත් නෙස්ටා ෆ්‍රැන්සිස් පෙරේරා වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ධර්මවර්දන ජයසිංහ විසින් ලියා සහතික කළ අංක 1518 සහ වර්ෂ 2005.09.01 දිනැති ඇටර්නි බලපත්‍රය වර්ෂ 2014 මැයි මස 09 වැනි දින සිට බලරහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර මින් පසු එකී අය විසින් මාගේ නමින් හෝ මා වෙනුවෙන් සිදුකරනු ලබන කිසිම ක්‍රියාවකට බලයකට, ඔප්පුවකට හෝ කරුණකට එකී අය වෙනුවෙන් මා වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

ජෙනිෆර් ඇන්ටනට් පෙරේරා.

2014 මැයි මස 09 වැනි දින.

05-794

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : කිටෝ ක්ලෝතිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 98404
ලියාපදිංචි ලිපිනය : අංක 27 1/1, රොස්මිඩ් පෙදෙස, කොළඹ 07.
ලියාපදිංචි කළ දිනය : 2014.05.05 වැනි දින.

සමාගමේ ලේකම්.

05-800

---

**නිවේදනයයි**

**ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම**

ගල්කිස්ස, වටරප්පොල පාරෙන් එපිට අබේසේකර පාරේ අංක 97 සී පදිංචි ආනන්ද දුෂ්මන්ත ගුණවර්ධන සහ ශ්‍රියා වත්සලා චාන්දනී ගුණවර්ධන යන දෙදෙනා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සරෝජා රේණුකා කරුණාරත්න විසින් සහතික කර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වෙළුම 101/64 දරන පොත්පත්වල සහ අංක 5404 දරන දින පොතෙහි 2012.08.07 දාතමින් යුතුව ලියාපදිංචි කර මා වෙත ලබාදී ඇති අංක 3730 හා 2012 මැයි මස 02 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය එකී ඇටෝර්නි බලපත්‍රයෙහි සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරා ගෙන යනු ලබන බැවින් අංක 3730 දරන එකී ඇටෝර්නි බලපත්‍රය 2013 දෙසැම්බර් මස 31 වැනි දින සිට මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර සහ බලරහිත කරන බව ගල්කිස්ස වටරප්පොල පාරෙන් එපිට අබේසේකර පාරේ අංක 97 සී හි පදිංචි හේමලතා චන්ද්‍රා කරුණාරත්න ගුණවර්ධන වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ එහි මහජනතාව වෙත මෙයින් නිවේදනය කර සිටිමි.

හේමලතා චන්ද්‍රා කරුණාරත්න ගුණවර්ධන.

2014 අප්‍රේල් මස 24 වැනි දින.

05-805

---

**නිවේදනයයි**

**ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම**

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. පී. එන්. අබේරත්න විසින් සහතික කරන ලදුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙහි වෙළුම 346/78 දරන පොත්පත්වල සහ අංක 16480 දරන දින පොතෙහි 2006.12.06 දාතමින් යුතුව ලියාපදිංචි කර මා විසින් දෙහිවල, පාමංකඩ, දුටුගැමුණු වීදියේ අංක 58 හි මනෝ රංජන් විජේබාහු වෙත ප්‍රදානය කරන ලද අංක 259 හා 2006 නොවැම්බර් මස 16 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය, එකී බලපත්‍ර අංක 259 හි සඳහන් අවශ්‍යතාවයන් සපුරාලමින් පවතින බැවින් එය මෙයින් අවලංගුකර ප්‍රත්‍යාදිෂ්ඨ කර සහ බලරහිත කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි මහජනතාව වෙත දෙහිවල, පාමංකඩ, දුටුගැමුණු වීදියේ, අංක 58හි පදිංචි රණසිංහ මුදියන්සෙලාගේ තිලකා ශ්‍රියානි මෙයින් නිවේදනය කර සිටිමි.

රණසිංහ මුදියන්සෙලාගේ තිලකා ශ්‍රියානි චන්ද්‍රසිරි.

2014 අප්‍රේල් මස 24 වැනි දින.

05-806

---

**ප්‍රසිද්ධ දැන්වීම**

සීමාසහිත ජී එස් එම් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම (සමාගම් අංකය පී වී 97708) වර්ෂ 2014 මාර්තු මස 20 වැනි දින සංස්ථාගත කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) උපවගන්තිය ප්‍රකාරව මෙයින් සෑම දෙනාගේ ම දැනගැනීම පිණිස දැනුම් දෙනු ලැබේ.

ලියාපදිංචි කාර්යාලය : අංක 934, අගිරිකුල මාවත, කොට්ටාව, පන්නිපිටිය ශ්‍රී ලංකාව.

05-807

---

**දැන්වීමයි**

අංක 90/6ජේ/02 ඩන්බාර් පාර, හැටන් හි පදිංචි කන්නප්පන් ශන්කර් වන මා මෙයින් ප්‍රසිද්ධව දන්වා සිටින්නේ මා විසින් 78/2ජේ පොන්නගර් හැටන් හි පදිංචි සොක්කලිංගම් සිවබාලසුන්දරම් නමැති පුද්ගලයා හට 2010.02.20 දින ලබාදුන් අංක 130 දරන ප්‍රතිනිතිබලය 2014.02.28 වැනි දින සිට අහෝසි කරන බව දන්වා සිටිමි.

05-835

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පූර්ව නාමය : ඉන්ටර්නැෂනල් හොස්පිටැලිටි මැනේජ්මන්ට් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 93741
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 76, දෙවැනි පටුමග, කොටිකාවත්ත පාර, ගොතටුව නව නගරය
සමාගමේ නව නාමය : ඉන්ටර්නැෂනල් හොස්පිටැලිටි ඇන්ඩ් මැනේජ්මන්ට් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්
පූර්ව නාමය වෙනස් වූ දිනය : 2014 අප්‍රේල් මස 29 වැනි දින.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-836

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : ද බාත් ස්ටෝර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98336
ලියාපදිංචි ලිපිනය : අංක 68, එස්. ඩී. එස්. ජයසිංහ මාවත, කොහුවල, කළුබෝවිල.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958.

05-842/1

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

සමාගමේ නම : ජේම්ස් විල්කි ඉන්ටීරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98367
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගෝල්ෆේස් කෝට් 02, කොළඹ 03.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී වී 5958.

05-842/2

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**
සමාගම් නාමය වෙනස් කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ සමාගම් නාමය වෙනස් කරන ලදී.
සමාගමේ පෙර නාමය : කෙවිල්ටන් ඉලෙක්ට්‍රිකල් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 4082
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 146, ඩෝසන් වීදිය, කොළඹ 02
සමාගමේ නව නාමය : කෙවිල්ටන් පවර්වෙයා (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් 2014.04.02 වැනි දින සිට වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂක/සමාගම් ලේකම්.

05-871

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**
සමාගම් නාමය වෙනස් කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ සමාගම් නාමය වෙනස් කරන ලදී.
සමාගමේ පෙර නාමය : පී ඊ ප්ලස් කැරුසල් මෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 4167
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 146, ඩෝසන් වීදිය, කොළඹ 02
සමාගමේ නව නාමය : කැරුසල් මෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂක/සමාගම් ලේකම්.

05-872

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| | *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|---|
| 1. | ප්‍රෝ එක්ස් නිව් සීලන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 98271 | 2014.04.28 | අංක 104, හැව්ලොක් සෙන්ට්‍රල් ගොඩනැගිල්ල, හැව්ලොක් පාර, කොළඹ 05 |
| 2. | ස්ටඩ් ප්ලස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 98366 | 2014.04.30 | අංක 129/1, ශ්‍රී සරණංකර පාර, දෙහිවල. |

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

05-837

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**මහජන බැංකුව - බදුල්ල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2014.06.27 වැනි දින පෙ. ව. 10.00 ට මෙහි පහත විස්තර වන දේපළ එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර**

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රදේශයේ, රිල්පොල කෝරළයේ වැදිගුනේ පිහිටි "කොලොන්ගහහේන කුඹුර කොලොන්ගහ- හේන, ගල්ගොඩේ හේන සහ ගල්ගොඩේවත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩමට අවසරලත් මිනින්දෝරු එම්. එම්. බී. දිසානායක යන අය සෑදූ 2002.04.24 දිනැති අංක 1360 දරන පිඹුරේ නිරූපනය කර ඇති ලොට් 1 වශයෙන් සලකුණු කොට ඇති බෙදා වෙන්කොට නිර්ණය කර ඇති රූඩ් තුනයි, පර්චස් තිස්හයයි දශම අටක (අ.0 රූ. 03, පර්. 36.8) වපසරියක් ඇති ලොට් 1 ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි වැව්ලි ඇතුළු සෑම සියලු දේත් වේ.

වැඩි විස්තර සඳහා 2010.04.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2011.01.10 වැනි දින දිනමිණ, ඩේලිනිව්ස් සහ තිනකරන් යන පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - බදුල්ල නගරයේ විහාරගොඩ හන්දියේ සිට පස්සර පාරේ කිලෝමීටර් 4ක පමණ දුර ගොස් 137 වැනි කිලෝමීටර් කණුවේ සිට පාරේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු 01% ක බදු මුදල,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු සහ නිවේදක ගාස්තු වශයෙන් රු. 1,000ක්,
5. විකුණුම් වියදම් හා වෙනත් ගාස්තු වෙතොත් එම මුදල ද, විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.
6. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුවේ අංක 24, දරන ආර්. එච්. ගුණවර්ධන මාවතේ පිහිටි බදුල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාරතුමා වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 055- 2222165, 055- 2223068
ෆැක්ස් : 055- 2222361.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකි ය. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ ඉතිරි මුදල දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ඒ වනවිටත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

සාම විනිසුරු ඩබ්. ජයතිලක,
උසාවි කොමසාරිස්, ප්‍රසිද්ධ වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.

අංක 48/1, කළුගල්පිටිය,
බදුල්ල.
දුරකථන අංක : 055- 2230846
072-3438130

05-830

---

**මහජන බැංකුව - බදුල්ල ශාඛාව**

